ප්‍රධාන ලේකම් කාර්යාලය - වයඹ පලාත

பிரதம செயலாளர் அலுவலகம் - வடமேல் மாகாணம்

**Chief Secretary's Office – North Western Province**

පළාත් සභා කාර්යාල සංකීර්ණය, කුරුණෑගල மாகாண சபை அலுவலகத் தொகுதி, குருநாகல் Provincial Council Office Complex, Kurunegala

ආයතන හා පරිපාලන අංශය தாபனமும் நிர்வாக பிரிவு **Establishment and Administration Division**


මගේ අංකය / எனது இலக்கம் / My No: NWP/CS/AD/1/25-2

ඔබේ අංකය / உமது இலக்கம் / Your No:

දිනය / திகதி / Date: 2022.07. 12

වයඹ ආණ්ඩුකාරවර ලේකම්,
සභා ලේකම් - වයඹ පළාත් සභාව,
ලේකම් - වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සියළුම පළාත් අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
සියළුම පළාත් දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත.

**කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ සංශෝධන - XVIII වැනි පරිච්ඡේදයේ 222 නිලධරයන්ගේ ඉල්ලීම මත කරනු ලබන සුහද ස්ථාන මාරු**

උක්ත කරුණට අදාලව ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක: NWP/GOV/AD/01/22/1 හා 2022.06.29 දිනැති වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංශෝධන 01/2022 ය හා බැඳේ.

02. එමගින් සුහද ස්ථාන මාරු සම්බන්ධයෙන් සිදු කෙරෙන කුමන ආකාරයේ ඉල්ලීමක් වුවද, එය සත්‍ය හා සාධාරණ වන්නේ නම් සහ කිසිවෙකුට අගතියක් නොවන්නේ නම්, ඒ සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වා ක්‍රියා කිරීම සදහා, වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ 222-IV උප වගන්තියට ඉක්බිතිව පහත උප වගන්තිය 222-V ලෙස එකතුකර සංශෝධනය කිරීමට වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 2022.06.28 දින ලැබී ඇති බව දන්වා ඇත.

**222 – V. සුහද ස්ථානමාරු ඉල්ලීමකට අදාලව පහත සඳහන් අවශ්‍යතා සම්පූර්ණ කර තිබේ නම්, අභිනියෝජිත බලධරයාට අවුරුදු 02 ක කාල සීමාව නොතකා තීරණයක් ගත හැකි වන්නේය.**

**I.** **සුහද ස්ථානමාරු ඉල්ලීමට හේතු ලෙස ඉදිරිපත් කර ඇති කරුණු, අතිශය සාධාරණ හා යුක්ති යුක්ත බවට අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ලිඛිතව, විධිමත්ව හා පෞද්ගලිකව තහවුරු කර ගෙන නිර්දේශ කර ඉදිරිපත් කර තිබීම.**

**II.** **පත්වීම් ලිපිවලට අදාළව නිකුත්කොට ඇති ස්ථානගත කිරීමේ ලිපිවල සඳහන් කාලය හා ස්ථානය පිළිබඳ කොන්දේසි සම්බන්ධයෙන් පරස්පරතාවයක් හෝ ගැටීමක් හෝ අනනුකූලතාවක් නොතිබීම.**

අයි.කේ.එම්.එම්.එස්.ඉලංගසේකර,
සහකාර ප්‍රධාන ලේකම් II (පරිපාලන).

අ/කළේ: පී.බී.එම්.සිරිසේන,
ප්‍රධාන ලේකම්,
වයඹ පළාත.

E:\AD 01\චක්‍රලේඛ\Circulars.all\2022\කාර්ය පටිපාටික රීති සංශෝධන\222.iv සංශෝධන.docx